# යේසුස් කැඳවයි

සැප්තැම්බර් 2024



## නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ

පොළොවේ සියලු ජාතීන්ට වඩා

## නුඹ උසස් කොට තබනසේක

ද්විතීය කථාව 28.1

# දෙවියන්වහන්සේ ඔබගේ හිස ඔසවනසේක




## මාගේ අනගි මිතුර,

ඔබගේ ජීවිතයේ විශාල වෙනසක් ලබා ගන්න සුදානම් වන්න. මක්නිසාද ඔබව ඉතා ඉහළ ස්ථානයකට ඔසවා තබන්න අද පටන් ගන්නා බවට දෙවියන්වහන්සේ පොරොන්දු වන හෙයිනි. උන්වහන්සේ ඔබට ගෞරව කර ඔබගේ හිස ඔසවා තබන්න යන්නේය. ඔබ විසින් දරා ගන්නා ලද ලැජ්ජාව උන්වහන්සේ දන්නා සේක. උන්වහන්සේ ඒ වෙනුවට ඔබට ගෞරවය ගෙන දෙන සේක.

**මෙම මාසයට පොරොන්දුව පැමිණෙන්නේ ද්විතීය කථාව 28:1 හි**

" නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේ පොලොවේ සියලු ජාතීන්ට වඩා නුඹ උසස් කොට තබන සේක "

ගීතාවලිය 3:3 හි දැක්වෙන පරිදි දෙවියන්වහන්සේ මුලින්ම කරන්නේ ඔබගේ හිස ඉහළට එසවීමයි.
"නුමුත් ස්වාමිනි ඔබ මා අවට පලිහක්ද මාගේ ගෞරවයද මාගේ හිස ඔසවන්නාද වන සේක".
"මම යන යන තැන ලැජ්ජාවට පත් වන්නේය කියා ඔබ කියන්නේද? මම කොහේ ගියත් මනුෂ්‍යයෝ මා ගැන වැරදි ලෙස කථා කරති. මගේ මුහුණ පෙන්නන්න තරම් මම ලැජ්ජා වෙමි" කියා ඔබ කියන්නේද?


ගීතාවලිය 3:3 හි දැක්වෙන පරිදි දෙවියන්වහන්සේ මුලින්ම කරන්නේ ඔබගේ හිස ඉහළට එසවීමයි. "නුමුත් ස්වාමිනි ඔබ මා අවට පලිහක්ද මාගේ ගෞරවයද මාගේ හිස ඔසවන්නාද වන සේක".
"මම යන යන තැන ලැජ්ජාවට පත්
වන්නේය කියා ඔබ කියන්නේද?
මම කොහේ ගියත් මනුෂ්‍යයෝ
මා ගැන වැරදි ලෙස කථා කරති.
මගේ මුහුණ පෙන්නන්න තරම්
මම ලැජ්ජා වෙමි" කියා ඔබ කියන්නේද?





**Dr. Paul Dhinakaran** - *paul@jesuscalls.org*

*Pauldhinakaranofficial*

“ඔබ සෑම විටම දෙවියන්වහන්සේ පසුපස යන්නේය. නමුත් උන්වහන්සේ ඔබට උපකාර කරාවිද?”යනුවෙන් ජනතාව ඔබගෙන් අසනවා විය හැකිය. ඔවුන් ඔබට නින්දා කරනවා ඇත.නමුත් ඔබ සේවය කරන දෙවියන්වහන්සේ එවැනි පුද්ගලයන් ඉදිරියේ ඔබගේ හිස ඔසවන දෙවියන්වහන්සේය. යෙසායා 61:7 හි මෙසේ ප්‍රකාශ කරන්නේය. “නින්දාව වෙනුවට ඔව්හු තමුන්ගේ කොටස ගැන ප්‍රීතිමත් වන්නෝය. එබැවින් ඔව්හු තමුන්ගේ දේශයෙහි දෙපංගුවක් භුක්ති විඳින්නෝය. සදාකාල ප්‍රීතිය ඔවුන්ට වන්නේය”. එසේය, දෙවියන්වහන්සේ ඔබට දෙපංගුවකින් ගෞරව කරන්න යන සේක.ශෙපනියා 3:19 හි මෙසේ පවසයි. “ඒ කාලයේදී නුඹට පීඩා කරන සියල්ලන්ට මම ප්‍රතිඵල දෙන්නෙමි. කොර ගස ගසා යන්නන් ගළවා පන්නා දැමුවන් රැස්කොට ඔවුන් ලැජ්ජාව වින්දාවූ සියලුම දේශවල ඔවුන් ප්‍රශංසාවක්ද නාමයක්දවෙන්ට සළස්වන්නෙමි”.ඔබව ලැජ්ජාවට පත්වූ ස්ථානයේදීම ඔබට ප්‍රශංසාවක් සහ ගෞරවයක් ලබා දී ඔබව උන්වහන්සේ වෙතට ඇද ගන්නා බවට පොරොන්දු වන සේක.

“ඇගේ ලැජ්ජා සහගත තත්ත්වය සහ පීඩාව වෙලාවේදී දෙවියන්වහන්සේ ඇය වෙතට අවුත් ඇගේ හිස ඔසවා ගෞරවය දැක්වූ සේක.මේ දෙවියන්වහන්සේ ඔබටද එසේම කරන සෙක. මක්නිසාදයත් උන්වහන්සේ ඔබගේ ලැජ්ජාව සහ මිනිසුන් ඔබට කරන නින්දාව කුරුසියේදී දරා ගත් සේක.සියලුම මනුෂ්‍යයන් ඉදිරියේ ඔබගේ හිස එසවීමට උන්වහන්සේ තමන්වහන්සේගේ හිසෙහි කටු ඔටුන්න දරා ගත් සේක. උන්වහන්සේ මෙලොව ඔබට උසස් වන්න සළස්වන සේක. ඔබගේ හදවත කරදර කර ගන්න එපා.ගීතාවලිය 23:5 හි දැක්වෙන පරිදි ස්වාමින්වහන්සේ ඔබගේ ජීවිතය උත්ථානය කර ඔබගේ හිස තෙලින් අලේප කරමින් උතුරා යන අත්දැකීමක් ඔබට ලබා දෙන සේක. “මාගේ සතුරන් ඉදිරියෙහි ඔබ මට කෑම මේසයක් පිළියෙළ කරන සේක. මාගේ හිස තෙලින් ආලේප කළ සේක. මාගේ කුසලාන උතුරා යයි”. ඔබට බොහෝ සතුරන් සිටිය හැකිය. ගීතාවලිය 9:13-14 දක්වා ගීතාවලිය රචකයා කළ ආකාරයට උපකාරය සඳහා ඔබත් ස්වාමින්වහන්සේ දෙස බලන්න .“මා විසින් ඔබගේ ප්‍රශංසා සියල්ල ප්‍රකාශ කරන පිණිසද සියොන් දුවගේ දොරටුවලදී ඔබගේ ගැළවීම කෙරෙහි ප්‍රීතිවන පිණිසද ස්වාමිනි, මරණ ද්වාරවලින් ඔසවන්නාවූ ඔබ මට ද්වේශකරන්නන්ගෙන් මා විඳින පීඩා බැලුව මැනව”. ස්වාමින්වහන්සේ ඔබගේ හඬ ඇසූ මොහොතේදීම ඔබගේ සතුරන්ගෙන් ඔබව ගළවා ගෙන ගීතාවලිය 27:6 හි දැක්වෙන පරිදි උසස් ස්ථානවලට ඔබව ඔසවා තබන සේක. “දැනුදු මා අවට සිටින මාගේ සතුරන්ට ඉහළින් මාගේ හිස ඔසවනු ලබන්නේය. උන්වහන්සේගේ මණ්ඩපයෙහි ප්‍රීති පූජා පුදන්නෙමි. ස්වාමින්ට ගීතිකා කරන්නෙමි. එසේය, ප්‍රශංසා ගී කියන්නෙමි”.මෙම මාසයේදී මෙම අනුග්‍රහය ඔබ වෙට පැමිණෙන්නේය. නික්මයාම 23:22 දෙවියන්වහන්සේ මෙසේ ප්‍රකාශ කරන සේක. “එහෙත් නුඹ සැබවින් උන්වහන්සේගේ හඬට ඇහුම් කන් දී මා කියන සියල්ල කළොත් මම නුඹේ සතුරන්ට සතුරෙක්ද විරුද්ධකාරයන්ට විරුද්ධකාරයෙක්ද වන්නෙමි”. ඒ අනුව දෙවියන්වහන්සේ ඔබගේ සතුරන්ගේ සතුරෙක් වන සේක. එම නිසා ඔබ කිසි කෙනෙක් කෙරෙහි විරුද්ධ විය යුතු නැත. ඔබගේ සතුරන්ට ආශීර්වාද කරන්න. ඔබ කළ යුත්තේ එපමණයි. යේසුස්වහන්සේ ඔබ පසෙක සිටිමින් ඔබ වෙනුවෙන් ඔබගේ සතුරන් සමග සටන් කරන සේක.1985 දී විශ්ව විද්‍යාලයක් සාදන ලෙසට දෙවියන්වහන්සේ මගේ පියාට දර්ශනයක් දුන් කෙණෙහිම වාගේ ඔහුගේ වකුගඩුවලට හානි සිදු වුනි. බොහෝ කිතුනු දේශකයන් ඔවුන්ගේ සඟරාවලට ලියා තිබුණේ මගේ පියා වන දිනකරන් බොරු දිවසිවරයෙක් බවත් ඔහුගේ වකුගඩු නරක් වූයේ විශ්ව විද්‍යාලයක් තැනීම ගැන ඔහු බොරු කිවූ නිසා බවත්ය.

“

**ඔබ ඔබේ පව්කාර මාර්ගවලින් ඉවත් වූ විට දෙවියන් වහන්සේ ඔබේ හිස ඔසවයි**

තිරුවල්ලූර් නම් ස්ථානයේ විසාලම් නම් සහෝදරියකගේ උද්යෝගිමත් සාක්ෂියක් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. ඇය බැංකු ණයක් ලබා ගෙන නිවසක් මිළදී ගත් නමුත් ණය ගෙවා ගත නොහැකිව ලක්ෂ 8 ක ණය කාරියක් වූවාය. ඇගේ දේපළ අයත් කර ගන්නා බවට තර්ජනය කරමින් බැංකුව ඇයට ලිපි කිහිපයක්ම එවා තිබුණි. මෙම වේදනාව දෙගුණ කරමින් පවුලේ එකම කෑම සපයන්නා වන ඇගේ ස්වාමි පුරුෂයාද මිය ගියේය.

ඇය මහත් ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නාය. තම ස්වාමිපුරුෂයා සේවය කළ ස්ථානයෙන් ඇය විශ්‍රාම වැටුපක් ඉල්ලා සිටි විට ඔවුන් කීවේ ඔහුගේ ණය නිසා ඇයට ලැබෙන්නේ ඉතා සුළු මුදලක් බවයි. ඇයට කිසිදු බලාපොරොත්තුවක් නැති විය. මේ අවස්ථාවේදී ඇය වනගුම්හි පැවති නිරාහාර හාස්කම් යාච්ඤාවට සහභාගී වූවාය. ඇය හාස්කමක් සඳහා දෙවියන්වහන්සේව සෙවූවාය. ඇය පුද්ගලික යාච්ඤාවන් ලබා ගැනීමට පෝලිමේ මා වෙතට ආවාය. ඇයගේ නිවස ගැන හාස්කමක් සඳහා දෙවියන්වහන්සේගේ උපකාරය ඉල්ලා මම මහත් උවමනාවෙන් යාච්ඤා කළෙමි.ඇය නිවසට ගිය අවස්ථාවේදී ඇය බලාපොරොත්තු වූවාටත් වඩා වැඩි රුඃ ලක්ෂ 5 ක මුදලක් ඇගේ ස්වාමි පුරුෂයාගේ රැකියා ස්ථානයෙන් ඇයට ලැබී තිබුණි. එයට අමතරව ඇයට නිවසේ අයිතිය පැවරෙන පරිදි බැංකුව ඇගේ ඉතිරි ණය මුදල අඩු කළේය. මෙම අත්දැකීම දෙවියන්වහන්සේගේ හාස්කම් කිරීමේ බලය ගැන ඇය තුළ බලාපොරොත්තුව සහ අළුත් ඇදහිල්ලක් ගෙන ආවේය.



## දෙවියන් වහන්සේ ඔබේ මොරගැසීම සවන් දී ඔබේ සතුරන්ගෙන් ඔබව ගලවා ගන්නා මොහොතෙදි ඔහුගේ ආශිර්වදය ඔබව විශාල ඉහළ ගෙන යනු ඇත

ඔවුහු මගේ පියා ගැන බොරු කථා පැතිර වූවා පමණක් නොව ඔහුගේ දේශනාවලට සවන් නොදෙන ලෙසට ජනතාවට අනතුරු ඇඟවූහ. නමුත් ඔවුන්ගේ නින්දා ගැනත් බොරු සාක්ෂි ගැනත් කරදර නොවන ලෙසට දෙවියන්වහන්සේ ඔහුට කී සේක.

එසේම මගේ පියා සමග සිටිමින් ඔහුව දිරිමත් කරන බවට උන්වහන්සේ පොරොන්දු වූ සේක. දෙවියන්වහන්සේ මරණීය ඇඳෙන් මගේ පියා නැගිටුවා පොරොන්දු වූ පරිදි ඉතාමත් ප්‍රසිද්ධ කාරුණ්‍යා විශ්ව විද්‍යාලය ඇති කළ සේක. අපි සේවය කරන්නේ කෙතරම් මනහර දෙවි කෙනෙක්ටද? එම නිසා බිය නොවන්න. උන්වහන්සේ ගෞරවයෙන් ඔබගේ හිසත් ඔසවන සේක. “නුඹට විරුද්ධව එකතු වන කවුරු නමුත් නුඹ නිසා වැටෙන්නෝය” (යෙසායා 54:15).

**අපගේ සතුරන් කවුරුන්ද?**

පාපය : අපි මුහුණ දෙන පළමු සතුරා පාපයයි

“මක්නිසාද පාපයේ කුලී නම් මරණයය. නුමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජීවනයය” (රෝම 6:3).

පාපය අපට එරෙහිව ක්‍රියා කරන අතර අපව අනාවරණය කර අනතුරට ලක් කරයි. එය අපේ මුදල්, සම්බන්ධතාවයන් සහ සුවය නැති කරන්නේය. ආදම් සහ ඒව පාපයට වැටුණු අස්ථාවේදී ඔවුහු තමන්ගේ නිරුවත් බාවය දැන ගත්හ. උන්වහන්සේ ඉදිරියෙහි අපට නිරුවත් හැඟීමක් ඇති වෙනවාට දෙවියන්වහන්සේ අකමැති වන සේක. කොලොස්සි 2:14 හි සඳහන් වන්නේ “අපට විරුද්ධව අපට එදිරිව තිබුණාවූ නියෝගවල ලියවිල්ල මකා දමා ඒක කුරුසියෙහි ඇණ ගසා අහක් කළ සේක” යනුවෙනි. අපගේ බලවත්ම සතුරා වන පාපයට එරෙහිව යේසුස්වහන්සේ ජයගත් සේක. අපව උන්වහන්සේගේ ධර්මිෂ්ඨ දරුවන් කරමින් උන්වහන්සේගේ රුධිරයට අපව සෑම පාපයකින්ම පවිත්‍ර කළ හැකි වන්නේය.

මම ටික කලකට පෙර එක් සත්‍යය කථාවක් කියෙව්වෙමි. ප්‍රධාන ක්‍රියාකාරී නිලධාරියාට දෙවෙනි වූ එක් මනුෂ්‍යයෙක් සමාගමක ඉහළ තනතුරක් දැරීය. සමාගමේ සියලුම ප්‍රධාන වගකීම් ඔහුට බාර විය. ප්‍රධාන ක්‍රියාකාරී නිලධාරියා විශ්‍රාම යන්නට ආසන්න වූ විට සෑම දෙනෙක්ම බලාපොරොත්තු වූයේ මොහුව එම තනතුරට උසස් කරනු ලබතියි කියාය.

කෙසේ වෙතත් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී එම තනතුර සඳහා අලුත් පුද්ගලයෙක් තෝරා ගන්නා ලදී. ඔහුගේ හදවත බිඳී ගොස් ඔහු ලැජ්ජාවට පත් වුනි. තම රැකියාව දිගටම කර ගෙන යාමට පවා ඔහුට සිත් නොදුනි.

නොදුනි. ඔහු දුම්පානයට ඇබ්බැහි වී දෙවියන්වහන්සේගෙන් ඈත්ව ගොස් දුම්පානය නිසා දරුණු කැස්සකින් රෝගාතුර විය. ඔහුගේ ජීවිතය කැඩී ගියාක් බඳු විය. මෙම අවස්ථාවේදී ඔහුගේ මිතුරෙක් ඔහුව මුණ ගැසී හදවතේ වෛරය තබා ගැනීම නිසා ඔහු තමාටම එරෙහිව පව් කරන බව කියා දුන්නේය. දෙවියන්වහන්සේ කෙරෙහිම එල්ලී සිටින ලෙසටත් කෝපය සහ දුම්බීම අත්හරින ලෙසටත් ඒ වෙනුවට අලුත් ක්‍රියාකාරී ප්‍රධානියාට සමාගම ගොඩ නැගීමට එකතු වන ලෙසටත් වැඩිදුරටත් කියා සිටියේය. ඔහු මෙම අවවාදය පිළිගත්තේය.

තමාගේ මරණීය තත්ත්වයෙන් ගොඩ ගන්නා ලෙසට දෙවියන්වහන්සේට යාච්ඤා කළේය. එසේම නව ක්‍රියාකාරී නිලධාරියා වෙතට ගොස් ඔහුගේ අත්දැකීම් සමග සමාගම ඉහළට ඔසවා තැබීමට ඉදිරිපත් වූයේය. ක්‍රියාකාරී ප්‍රධානියා බොහෝ සෙයින් ප්‍රීතියට පැමිණ දෙදෙනාම එකතුවී සමාගම ඉහළට ඔසවා තැබුවේය. අලුත් ක්‍රියාකාරී ප්‍රධානියා විශ්‍රාම යන විට අධ්‍යක්ෂක මණ්ඩලය ඔහුව එම තනතුරට පත් කළේය. දෙවියන්වහන්සේ ඔහුගේ ජීවිතයට ගෞරවය ගෙන ආ සේක.

ඔබත් ඔබගේ පාපකාරී ජීවිතයෙන් මිදෙන කල ඒ ආකාරයෙන්ම දෙවියන්වහන්සේ ඔබගේද හිස ඔසවන සේක. ඔබ දෙවියන්වහන්සේගෙන් සමාව ඉල්ලා ඔබගේ පාප අත්හරින විටම මෙය සිදුවන්න පටන් ගන්නේය. ඒ ඔබගේ බලවත් සතුරා වන පාපය දෙවියන්වහන්සේගේ බලයෙන් විනාශ වන විටය.

දුෂ්ඨ මිනිසුන් : අපි මුහුණ දෙස අනෙක් සතුරා නම් දුෂ්ඨ මිනිසුන්ය. 2 තෙසලෝනික 3:2 හි පාවුල් මෙසේ කියයි : “හිතුවක්කාර නපුරු මනුෂ්‍යයන්ගෙන් අප ගළවනු ලබන පිණිසද අප උදෙසා යාච්ඤා කරපල්ලා. මක්නිසාද සියල්ලන්ටම ඇදහීම නැත”මීකා 7:6 හි සඳහන් වන්නේ “මක්නිසාද පුත්‍රයා පියාට අගෞරව කරයි. දුව ඇගේ මවර විරුද්ධවද යෙහෙළී ඇගේ නැන්දාට විරුද්ධවද නැගිටියි. මනුෂ්‍යයෙකුගේ සතුරෝ නම් තමාගේම පවුලේ අයවල්ය” යනුවෙනි.

බොහෝ අවස්ථාවන්වලදී පවුලේ සාමාජිකයන් එකිනෙකාට එරෙහිව විවිධ හේතූන් නිසා එරෙහි වෙති. බොහෝ විට ඊර්ෂ්‍යයාව සහ දේපළවලට ඇති තණ්හාව නිසාය. නමුත් අපගේ සතුරන් ඉදිරියේ අපගේ හිස් ඔසවන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වන සේක. එකම දෙය නම් ජනතාව කෙරෙහි ඊර්ෂ්‍යයා කරන්නවත් තිත්තකම ඇති කර ගන්නවත් එපා. අපගේ වේදනාව හඳුනා ගන්නත් සතුරන් ඉදිරියේ අපව ඔසවා තබන්නත් යේසුස්වහන්සේ වෛරය දරා ගත් සේක.

එසේම මෙම වෛරය දෙවියන්වහන්සේ කුරුසියේදී විනාශ කර දැමූ සේක. එපීස 2:16-18 හි මෙසේ සඳහන් වන්නේය. " කුරුසියෙන් නපුරුකම නැසූ බැවින් දෙගොල්ලම එක ශරීරයක් කොට කුරුසිය කරණකොට ගෙන දෙවියන්වහන්සේට සමගි කර දෙන පිණිසත් උන්වහන්සේ ඇවිත් දුර සිටියාවූ නුඹලාට සමාදානයද ළඟ සිටියවුන්ට සමාදානයද දේශනා කළ සේක. මක්නිසාද උන්වහන්සේ කරණකොටගෙන අප දෙගොල්ලට එක ආත්මයාණන් වහන්සේ තුළ පියාණන්වහන්සේ ළඟට පැමිණීමේ පුළුවන්කම තිබේ".

සාතන් : අප මුහුණ දෙන තුන්වන සතුරා වන්නේ සාතන්ය. ගීතාවලිය 143:3 හි මෙසේ සඳහන් වන්නේය."සතුරා මාගේ ආත්මයට පීඩා කෙළේය. ඔහු මාගේ ජීවිතයට පහර දී බිම හෙළුවේය. ඔහු වනාහි මැරී බොහෝ කල් ගිය වුන් මෙන් අඳුරු තැන්වල විසීම මට සැලැස්වීය". සාතන් එන්නේ සොරකම් කරන්නත් මරණ්නත් විනාශ කරන්නත්ය (යොහන් 10:10). "සොරා එන්නේ සොරකම්කරන්ටත් මරණ්ටත් විනාශ කරන්ටත්ය".

බොහෝ විට මනුෂ්‍යයන්ගේ දුෂ්ඨ වචන සහ ක්‍රියාවන් අපව විනාශ කරන්න උත්සාහ කරන යක්ෂයාගෙන් පැමිණෙන දේවල්ය. උදාහරණයක් ලෙසට යුදස්ගේ ජීවිතයේ ඔහු යේසුස්වහන්සේව පාවා දෙන ලෙසට කියූ දුෂ්ට මිනිසුන්ගේ වචනවලට ඇහුම්කන් දුන්නේය. මනුෂ්‍යයන් තුළින් යක්ෂයා ඔහුව පෙළඹුවේය. ඔහු මෙම වචනවලට සවන් දෙන්න පටන් ගත් විට යක්ෂයා ඔහු තුළට ඇතුල් විය.

ඒ අනුව ස්වාමිවූ යේසුස්වහන්සේ කුරුසිය මතදී සියල්ල දරා ගෙන වෛරය විනාශ කර දැමුවේ පවුල් එකමුතු කර සම්බන්ධතාවයන් නැවත ගොඩ නැගීමට උන්වහන්සේට හැකි වන ලෙසටය.ඔබත් සමග සත්‍යය සාක්ෂියක් බෙදා ගැනීමට කැමැත්තෙමි. පංජාබිහී මන්දීප් වසර හතක් පුරාවටම විදේශ රටක රැකියාවක් සඳහා යාම පිණිස උත්සාහ කළත් සෑම විට විසා ප්‍රතික්ෂේප වුනි.

> "
> ඔබේ ජීවිතය යේසුස් වහන්සේට භාර දෙන්න, එවිට ඔහු ඔබව සතුරාගේ සියලු උගුල්වලින් මුදාගෙන ඔබව ඔසවයි

අවසානයේදී යුදස්ගේ ජීවිතය විනාශ වී ඔහු දිවි නසා ගත්තේය. මාගේ මිතුර, කිසිම විටෙක නපුරු මිනිසුන්ට ඉඩ දෙන්න එපා. මක්නිසාදයත් ඔබව විනාශ කර දැමීමට සාතන් ඔවුන්ව පාවිච්චි කරන හෙයිනි.සෑම දිනකම බයිබලය කියවන්න. දෙවියන්වහන්සේගේ වචනයට සවන් දෙන්න. ඔබගේ හදවත ආරක්ෂා කර ගන්න. යොහන් 8:44 හි සාතන්ව විස්තර කරන්නේ ඔහු පටන්ගැන්මේ සිට මිනීමරුවෙක් ලෙසටය.

ඉන්පසුව 2021 දී ඔහු ඇනීටාව විවාහ කර ගත්තේය.කෙසේ වෙතත් ඔවුන්ගේ විවාහය වැඩි කල් නොපැවතුනේ සමහර ඥාතීන් විසින් බොරු චෝදනා නගමින් ඔවුන්ට විරුද්ධව නඩු පවරා ඇප නොමැතිව මන්දීප් දින 40 ක් සිර ගෙදරට යාම නිසාය. ඒ කාලය මෙම පවුලට ඉතාම කණගාටුදායක කාලයක් වූ අතර අවසානයේ ඔවුහු උපකාරය සඳහා යේසුස් කැඳවයි යාච්ඤා කුළුණේ පිහිට පැතුහ. ආශ්චර්යයමත් ලෙස 40 වන දිනයේදී මන්දීප් නිදහස ලැබුවේය. අවසානයේදී උසාවිය ඔහුව නිදොස් කරමින් නඩුව නිශ්ප්‍රභ කළහ.

එයට කෘතඥතාවය පළ කරනු වස් ඔවුහු 2022 දී යේසුස් කැඳවයි රූපවාහිනි වැඩ සටහනකට අනුග්‍රහය දැක්වූ අතර එහිදී මම ඔවුන්ගේ වීසා බලපත්‍රය වෙනුවෙන් ඉතා උනන්දුවෙන් යාච්ඤා කළෙමි. මොන පුදුමයක්ද! ඉතා ඉක්මණින් ඔවුන්ට එංගලන්තයට වීසා ලැබුණි. මාගේ මිතුර මෙවැනි දේවල් ඔබ වෙනුවෙන්ද විය හැකිය. දුෂ්ඨ පුද්ගලයන් විසින් ඇති කරන ලද සෑම බාධාවක්ම දෙවියන්වහන්සේගේ බලයෙන් බිඳී යනවා ඇත . එම නිසා දිරිමත් වන්න.

එසේම ඔහු තුළ සැබෑකම නැති හෙයින් ඔහු සැබෑවෙහි නොපැවතුණේය කියාය. ඔහු බොරු කාරයෙක්ය. බොරුවේ පියාය. ඔහු වෙස් වළා ගෙන එන්නේ අපට අනතුරු කරන්නත් වේදනා ගෙන දෙන්නත් අපව විනාශ කරන්නත්ය. නමුත් මාගේ මිතුර, ධෛර්‍යමත් වන්න. ස්වාමින්වහන්සේ උන්වහන්සේගේ ශුද්ධාත්මයෙන් ඔබව ආලේප කර ගරුත්වයෙන් සහ ජයග්‍රහණයෙන් ඔබගේ හිස ඔසවන සේක.මාලතී නම් වූ සහෝදරියක් සිටියාය. පවුලේ ප්‍රශ්න නිසා මාලතීගේ පවුලේ උදවිය හදි හූනියම් පුහුණු කළහ.

මෙය ඇගේ මානසික තත්ත්වය අස්ථාවර කළේය. බොහෝ වෛද්‍ය ක්‍රම අනුගමනය කළත් ඇගේ සෞඛ්‍යය තත්ත්වයේ කිසිදු වර්ධනයක් සිදු නොවුනි. අවසානයේ ඇයත් ඇගේ ස්වාමි පුරුෂයාත් යාච්ඤා සහාය පතා යේසුස් කැඳවයි යාච්ඤා කුළුණ වෙතට පැමිණියහ. යාච්ඤා කාලය අතර තුරදී ඇයට පීඩා කරන ලද දුෂ්ට ආත්මයෙන් ඇය මිදුණු අතර දෙදෙනාටම දේව අභිමුඛයේ සමාදානය ලැබුණි.ඉන්පසුව ඔවුහු ක්‍රිස්තුස්වහන්සේ ගැන දැන ගෙන දැන් දෙදෙනාම ස්වාමින්වහන්සේට සේවය කරති.




# අතපසු කිරීම් මග හරවා ගන්නේ කෙසේද?

ජෝ අෂීස් මහතා

## ප්‍රශ්නය සහ පිළිතුර

## සැමුවෙල් පෝල් දිනකරන් පිළිතුරු දෙයි.....

අතපසු වීම් අද දවසේ බොහෝ තරුණ ජීවිතවලට බලපාන්නේය. එය ඉතා භයානකය. මක්නිසාදයත් එය තේරුම් ගැනීමට අපහසු මෙන්ම නොවැදගත් යයි පෙනෙන්ට තිබෙන හෙයිනි. කෙසේ වෙතත් මෙය අපගේ ශරීරයේ වහාම ක්‍රියාත්මක විය යුතු දෙයක් නොවුවහොත් එය අපව ගැඹුරු වළක වළදමනු ඇත.

අපි බොහෝ විට අපගේ අධ්‍යාපන කටයුතු අතපසු කරන්නෙමු. එදින් එදා තමන් ඉගෙන ගත් දේ පසෙකට දමමින් පසුව එය අධ්‍යයනය කළ හැකි යයි කියන්නෙමු. “මම විභාග දිනයට පෙර දිනයේ පාඩම් කරන්නෙමි” යනුවෙන් සිතන්නෙමු. එසේම විභාගයට පෙර දිවා රාත්‍රී නොනිදා පාඩම් කරන්නෙමු යයි සැළසුම් කරන්නෙමු. නමුත් මෙය උපකාර වන්නේ නැත.

අපි සෑම දෙයක්ම හෙටට කල් දමන්නෙමු. අපගේ මව හෝ පියා හෝ අපට යමක් කරන්න කී කල අප එය හෙටට හෝ අනික් සතියට කල් දමන්නෙමු. “ස්වාමිනි මම බයිබලය හෙට කියවන්නෙමි” කියමින් අපි බයිබලය පවා කියවීම කල් දමන්නෙමු. මම කල් දැමීමේ ආත්මය අපගේ ජීවිතයේ සෑම දෙයකටම බලපාන්නේය. අපි කල් දමන්නන් වන්නෙමු. සුදානම් වන්නේ බොහෝ ප්‍රමාද වෙලාය.ෙ බලපෑමක් ඇති කිරීම අතපසු කරයි. වෙලාවට දේවල් ලබා නොදෙයි.

එමෙන්ම පොරොන්දු රකින්නේ නැත. ක්‍රමයෙන් එය අපගේ ජීවිත වලට බලපාන්නේය. එම නිසා එය පවත්වා ගෙන යාම භයානක වන්නේය.

මාගේ මිතුර, අතපසු වීම පුරද්දක් පමණක් නොවේ. එය ආත්මික රෝගයකි. මතෙව් 26:41 හි යේසුස්වහන්සේ මෙසේ කියන සේක : “නුඹලා පරීක්ෂාවට නොපැමිණෙන පිණිස අවදිව ඉඳ යාච්ඤා කරපල්ලා. ආත්මය නම් කැමතිය. නුමුත් මාංසය බෙලහීනය”. ඔබ අවදිව යාච්ඤා කරන කල අතපසු කිරීමේ පරීක්ෂාව ඔබ අත්හරින අතර ඔබගේ ආත්මය ශක්තිමත් සහ කැමති වන්නේය.

අතපසුවීම ඔබගේ ජීවිතයේ කොටසක් කර ගැනීමට ඔබ ඉඩ හැරියහොත් ඔබව පෙළඹවීමක් නොමැති බැවින් කිසිම දෙයක් කිරීමට අකමැති ආත්මයක් ඔබ වර්ධනය කර ගන්නේය. ඔබ සෑම දෙයක්ම පසෙකට දමන්නේය. ඔබගේ ආත්මයද දුර්වල වන්නේය. මෙය ඉතාමත්ම අනතුරුදායක වන්නේය. මක්නිසාද ශරීරය දුර්වල වුවත් ඔබගේ ආත්මයේ ඇති ශක්තිය සහ කැමැත්ත ඔබගේ ශරීරය ප්‍රාණවත් කර එය ඉදිරියට තල්ලු කරනවා ඇත. නමුත් ආත්මය දුර්වල වූ විට එය හරියට මළ මිනිසෙක් ජීවත් වෙනවා වාගේය. එම නිසා යේසුස්වහන්සේ පවසන පරිදි කැමැත්තෙන් යුත් ආත්මයක් වර්ධනය කර ගැනීම සඳහා අවදිව යාච්ඤා කරන්න.

මෙම දුර්වල ආත්මය අප වර්ධනය කර ගන්නේ කෙසේද? අපි දුර්වල ආත්මයක් වර්ධනය කර ගන්නේ අපට ජීවිතයේ කිසිම අරමුණක් හෝ ඉලක්කයක් නැති නිසාය. අපි බොහෝ විට " මම පසුව බරපතලව සිතන්නම්" කියා සිතමින් අරමුණක් නොමැතිව ගමන් කරමින් අවසානයේදී

> **"කල් දැමීම පුරුද්දක් නොවේ, එය ආත්මික රෝගයකි."**

මගේ විද්‍යාල කාලයේදී දෙවියන්වහන්සේ මට මෙම පාඩම ඉගැන්වූ සේක. මුලදී මම මගේ පාඩම් වැඩ ගැන බොහෝ ජ්වලිතව සිටියත් පසු කාලීනව සෙල්ලක්කාර චරිතයක් වර්ධනය කර ගෙන මිතුරන් සමග කාලය නාස්ති කළෙමි. මගේ අවධානය බිඳී පාඩම් වැඩ වලින් මම ඉවත් වීමි. එසේම බයිබලය කියවීම පවා මග හැරියෙමි.

අලස ජීවිත රටාවකට හැඩ ගැසෙන්නෙමු. මෙම අලසකම අපගේ කැමැත්ත නැති කරමින් බොහෝ පරීක්ෂාවන්ට මග සලස්වයි. එනම් සෑම දිනකටම අවශ්‍යය හරිදේ කිරීමට ඇති කැමැත්තය. ඒක හරියට ගින්නෙන් හා ජ්වලිත කමෙන් පිරී සිටින කෙනෙක් මතට වතුර වත්කරනවා හා සමානය. අපි හිතන්නේ කල් දැමීම කෙනෙක්ව රිදවන්නේ නැත කියාය. කෙසේ වෙතත් අතපසු කිරීම් අපට බොහෝ සෙයන් බලපාන්නේය.

1)ස්වාමින්වහන්සේ කෙරෙහි බලපායි.අප වෙනුවෙන් වූ ස්වාමින්වහන්සේගේ සැළසුම් වලට එය බලපායි. සෑම දිනකම අප තුළින් බලවත් දෙයක් කිරීමට දෙවියන්වහන්සේ සැළසුම් කරන සේක. උන්වහන්සේ ආශා කරන්නේ උන්වහන්සේගේ දරුවන් ඔවුන්ගේ අධ්‍යාපනයෙන්ද තලෙන්ත සහ ආත්මික ජීවිතයේද බැබළීමය. අපි අතපසු කිරීම් කරන විට අපි උන්වහන්සේගේ සැළසුම් ඉවත දමා උන්වහන්සේව නොසතුටට පත් කරන්නෙමු. අපි නුසුදුසු සේවකයන් යයි සිතා දෙවියන්වහන්සේ අපව අත්හැරියොත් හෝ උන්වහන්සේගේ අනුග්‍රහය ආපිටට ලබා නො ගත හොත් සිදුවන දේ සිතා බලන්න. එය භයානක සිතුවිල්ලකි.

2)අපගේ දෙමාපියන් කෙරෙහි බලපායි. අපි අපගේ දෙමාපියන්ගේ බලාපොරොත්තු සුන්කර ඔවුන්ගේ නාමය කෙළසන්නේය. කණ්ඩායමකදී එහි සිටින සෑම සාමාජිකයෙක්ගේම බලාපොරොත්තු සුන් කර දමති. අපගේ ප්‍රමාදයන් අප අවට සිටින්නන්ටද බලපාන්නේය.

පවුලේ යාච්ඤා වලදී පැවසුනු අනාවැකි වලින් ප්‍රකාශ වූයේ මට ස්වාමින්වහන්සේ ඉදිරියෙහි සිටින ලෙසත් උන්වහන්සේට සවන් දෙන ලෙසත්ය. නමුත් මම උන්වහන්සේගේ හදවත බිඳිමින් මගේ දෙමාපියන්ට ලැජ්ජා කරමින් මමද අසමත් වීමි. මාගේ මිතුර, අතපසු වීම් ඔබගෙන් යැපෙන අයව රිදවන අතර ස්වාමින්වහන්සේව අප්‍රසන්න කරන්නේය, එම නිසා මෙම අතපසු වීමේ ආත්මයට හිස ඔසවන්න නොදෙන්න, අපට අවශ්‍ය වන්නේ උද්යෝගිමත් කැමැත්තක් ඇති ආත්මයක්ය, අප කිරීමට අවශ්‍ය දේ පහත දැක්වේ

1)සැළැස්මක් සහිත ජීවිතයක් ගත කරන්න, ඔබගේ දෛනික කටයුතු සැළසුම් කර ඒවා ඉෂ්ට කිරීමට උත්සාහ කරමින් අතපසු වීම පරාජය කරන්න, මගේ මාමා කෙනෙක් කියන්නේ "හෙටක් නැති හැටියට එය කරන්න" යනුවෙනි.

2)දෙවියන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කරන්න. දෙවියන්වහන්සේ ක්‍රියා කරන්නේ සැළසුම් සහිත ව්‍යුහයකට අනුවය.

ගීතාවලිය 139:16 හි සඳහන් වන්නේ "ඔබගේ ඇස්වලට මාගේ ශරීර ධාතුව පෙණුනේය. ඔබගේ පොතෙහි මාගේ සියලු අවයවයෝ ලියන ලද්දෝය. ඒවායින් එකක්වත් නැති කල්හි දවසින් දවස ඒවා සාදන ලද්දේය". දෙවියන්වහන්සේ සෑම දෙයක්ම සැළසුම් කළ සේක. උන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන්නේත් එසේ සැළසුම් කිරීමක් හා ව්‍යුහයක්ය. සෑම දිනකම කළ යුතු දේ සැළසුම් කර එය ශක්තිමත්ව හා ජ්වලිතව කරන්න.

**"නුඹලා පරීක්ෂාවට නොපැමිණෙන පිණිස අවදිව ඉඳ යාච්ඤා කරපල්ලා. ආත්මය නම් කැමතිය. නුමුත් මාංසය බෙලහීනය".**

**මතෙව් 26.41**



# සාක්ෂි

## නුඹලා ශෝකවන්නහුය, නුමුත් නුඹලාගේ ශෝකය ප්‍රීතියට හැරෙන්නේය.

### යොහන් 16.20



සහොදරි තුශාරි

දෙවියන් වහන්සේට මහිමය වේවා. තුශාරි කරුණාරත්න වන මම රාගම ප්‍රදේශයේ ජීවත් වේ. මගේ පුතා වැඩි දුර ඉගෙන ගැනීම සඳහා ඔහුගේ රැකියාවෙන් ඉවත් විය. අවුරුදු එක හමාරක් පමණ වන තෙක් ඔහුට රැකියාවක් නොතිබුණි. ඒ පිළිබඳව ඔහුගේ සැලකීමක් හෝ උනන්දුවක් ද නොතිබුණි. මම සෑම බදාදා දිනකම යේසුස් කැදවයි යාච්ඤා කුළුන වෙත පැමිණ මෙම ප්‍රශ්නය සඳහන් කොට යාච්ඤා කර ගත්තාය . මගේ පුතාට රැකියාවක් නොමැති වීම මගේ සිතට දැඩි ලෙස කණගාටුවක් ගෙන එන ලදියි. මම ගෙදර ගොස් මේ පිළිබද පැවසූ විට ඔහු ප්‍රකාශ කර සිටියෙ ඔහු ඉගෙන ගන්න විශ්ව විද්‍යාලය වෙත රැකියා ආයතනයකින් කතා කර රැකියා අවස්ථාවක් සඳහා ඔහුව තෝරා ගෙන ඇති බවයි. මාගේ යාච්ඤාව හට පිළිතුරු දුන් දෙවියන් වහන්සේට ස්තූති වේවා.

---

දෙවියන් වහන්සේට මහිමය වේවා. මගේ නම නසියා.. මම ජීවත් වෙන්නේ මාලිගවත්ත ප්‍රදේශයේ.. මම මාස හයක කාලයක් පුරාවට ශරීරය කෙට්ටු වීමත් සමග උණ රෝගයකින් පෙළුණි. ඉන් පසුව මම වෛද්‍යවරයෙක් හමුවී ප්‍රතිකාර ලබා ගත්තේය. එම ප්‍රතිකාර වලින් උණ රෝගය සමනය වුවත් ශරීරයේ දුර්වලතාවයන් එලෙසම පැවතුණි.නැවත වරක් වෛද්‍යවරුන් හමු වී ඒ පිළිබදව විමසා පරීක්ෂණ කිරීමෙන් තහවුරු වූයේ මම තයිරොක්සින් රෝගයෙන් පෙළෙන බවයි.ඒ සදහා වෛද්‍යවරුන්ගේ නිර්දේශය වූයේ මා හට සැත්කමක් කිරීමට අවශ්‍ය බවයි. කෙසේ නමුත් මේ කාලය අතර තුර යේසුස් කැදවයි සේවයේ යාච්ඤා වීරවරියෙක් ලෙස මා කලාවු සේවය නොකඩවාම පවත්වාගෙන ගියා ය. මේ සියලු කාරණා හේතු කොට ගෙන මේ වන විට දෙවියන් වහන්සේ මා හට සුවය ලබා දී මා සම්පූර්ණයෙන්ම සුව කල අවසන් වී ඇත.. දෙවියන් වහන්සේට ස්තූතියි වේවා



සහොදරි නසියා

තරුණ පිටුව

# බිය ජයගැනීම

## ප්‍රිය මිතුර

**මෙම මාසය සඳහා ඔබව ඔසවා තබන දෙයක් ඔබ හා බෙදා ගැනීමටකැමැත්තෙමි. එය සඳහන් වන්නේ 2 තිමෝති 1:7 හිය.**

**"මක්නිසාද දෙවියන්වහන්සේ අපට දුන්නේ බයාදුකමේ ආත්මයක් නොව බලයෙන් ප්‍රේමයෙන් හික්මවීමෙන් ආත්මයක්ය" යනුවෙනි.**

බිය යනු අපව නවතා තබන අපගේ අරමුණු කරා යාමෙන් අපව වළකන සහ පූර්ණ වශයෙන් ජීවිතය භුක්ති විඳීම වළක්වන තදබල හැඟීමකි. නමුත් බයිබලය බලාපොරොත්තුවක් සහ සහනයක් ලබා දෙන්නේ දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් බිය ජයගත හැකි බවටය. නමුත් දෙවියන්වහන්සේ අපට ලබා දී ඇති "බලයෙන් ප්‍රේමයෙන් හික්මවීමෙන්"



ආත්මයකින් බිය ජය ගත හැක්කේ කෙසේදැයි අපි සළකා බලමු. එසේම මෙය කරන්නේ කෙසේදැයි පෙන්වන ඇත්ත ජීවිතයේ සිදුවීමක් දෙසද බලමු.

සාමාන්‍යයෙන් බිය ඇති වන්නේ සිදුවන්න යන්නේ කුමක්ද නොදැන සිටීමෙන්ද අපට අනතුරක් සිදුවේය"ය.

යන හැඟීමෙන්ද එසේත් නැත්නම් අපට නොතේරෙන දේවල් වලට මුහුණ දීමෙන්ද වන්නේය. අපට භය සිතෙන දේවලදී මෙය සිදුවන සාමාන්‍ය දෙයකි. නමුත් එය අපගේ ජීවිත අත්පත් කර ගන්නා විට දෙවියන්වහන්සේගේ අරමුණු ඉෂ්ට කිරීමට භාධාවන් සිදුවන්නේය. බයිබලයේ බොහෝ අවස්ථාවල "බිය නොවන්න" යයි අණ කර තිබේ. එයින් පෙන්නුම් කරන්නෙ බිය යන්න දෙවියන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු නොවන දෙයක් වීමය. ඒ වෙනුවට බලය, ප්‍රේමය සහ හික්මවීමෙන් ආත්මයකින් දෙවියන්වහන්සේ අපව සන්නද්ධ කර ඇත

### බලය

දෙවියන්වහන්සේ අපට ලබා දෙන බලය පුදුමාකාර වන අතර එය මෙලොව කිසි දෙයකින් නොලැබේ. ඒ අප තුළ ජීවත්වන ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පැමිණෙන ශක්තියකි.

Dr. Shilpa Samuel - shilpasd@jesuscalls.org

# දෙවියන් වහන්සේ අපට ලබා දී ඇති බලය , ආදරය සහ හොඳ මනස අල්ලා ගැනීමෙන් අපට බිය සහ බිය ජය ගත හැක

මෙම දිව්‍යමය බලය අසීරු කාලවලදී සහ අමාරු තත්ත්වයන් වලදී කටයුතු කළ ආකාරය ගැන ශක්තියක් සහ ස්ථිරත්වයක් ලබා දෙන්නේය. පිලිප්පි 4:13 හි මෙසේ සඳහන් වන්නේය : "මා බලවත් කරන්නාවූ තැනන්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන". අපි දෙවියන්වහන්සේගේ බලය කෙරෙහි රැඳෙන විට අපට බියට මුහුණ දී අපගේ බය පරාජය කළ හැකිය.

**ප්‍රේමය**

සම්පූර්ණ ප්‍රේමය භය දුරු කරයි (1 යොහන් 4:18). දෙවියන්වහන්සේ අපට කෙතරම් ප්‍රේම කරනවාද කියා අපට තේරුම් ගිය විට අපගේ බය මදක් අඩු කිරීමට එය අපට උපකාර වන්නේය. දෙවියන්වහන්සේ සහ අපගේ බන්ධනය බිඳ දැමීම කිසිවකට නොහැකි හෙයින් අපට ආරක්ෂිත බවක් දැනේ (රෝම 8:38-39). දෙවියන්වහන්සේගේ මෙම දිව්‍යමය ප්‍රේමයේ ගැඹුරු දැන ගැනීම අපට ආරක්ෂිත සහ සමාදානයේ අත්තිවාරමක් ලබා දෙන්නේය. දෙවියන්වහන්සේ නිතරම අප පසෙකින් සිටින බව දන්නා නිසා අපගේ බියට මුහුණ දෙන්න අපට උපකාර කරයි.

**හික්මවීමේ මනස**

හික්මවීමේ මනසක් ඇත්තේය යන්නෙන් අදහස් වන්නේ අපට ස්ව-විනයක්ද පැහැදිළි සිතුවිලිද අසීරු අවස්ථාවන් වලදී සන්සුන්ව නොසැළී සිටීමට ඇති හැකියාවටය. එනම් එයින් අදහස් වන්නේ බියෙන් නොව ඇදහිල්ල මත පදනම්ව නිවැරදි තීරණය ගත හැකි බවයි. හිතෝපදේශ 3:5-6 හි දැක්වෙන්නේ
"නුඹේම නුවණෙහි නොපිහිටා නුඹේ මුලු සිතින් ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාස කරපන්න" යනුවෙනි. අප කරන සෑම දෙයකදීම අපි ස්වාමීන්වහන්සේව පිළිගන්නේ නම් උන්වහන්සේ අපට මග පෙන්වා අපගේ මාර්ග සමතලා කරන සේක. දෙවියන්වහන්සේගේ ප්‍රඥාවෙන් මග පෙන්වනු ලබන හික්මවීමේ මනස අපට බියෙන් ජයග්‍රහණය කරන්න සළස්වන්නේය.
ඇත්ත ජීවිතයේ සිදුවූ දෙයක් ගැන ඔබ හා බෙදා ගන්නෙමි. ජෝන් නැමැත්තා නවීන අදහස් තිබුණු දක්ෂ ව්‍යාපාරිකයෙක් විය. නමුත් ආර්ථිකය කඩා වැටී ඔහුගේ ව්‍යාපාරවල මුදල් නැති වන්න පටන් ගත්තේය. ජෝන් බොහෝ සෙයින් බියට පත් විය. ඔහු අසමත් වේය කියාද ඔහුගේ මුදල් සියල්ලම නැති වේය කියාද මෙතෙක් මහත් වෙහෙසක් දරා උපයාගත් සෑම දෙයක්ම නැති වේය කියාද ඔහු බිය වූයේය. ඔහු කෙතරම් බියට පත් වූයේද කිවහොත් ඔහුට නින්ද නැති විය.

මෙම කලබලකාරී තත්ත්වය මත සහනයක් සහ මග පෙන්වීමක් බලාපොරොත්තුවෙන් ජෝන් බයිබලය පෙරලීය. එක් රාත්‍රියක 2 තිමෝති 1:7 ඔහුගේ හදවත වෙළා ගත්තේය. මෙම පදය ඔහුගේ හදවතට කථා කළේය. එනම් බිය දෙවියන්වහන්සේගෙන් නොවන බවත් දෙවියන්වහන්සේ ඔහුට දී ඇත්තේ බලයේත් ප්‍රේමයේත් හික්මවීමේත් ආත්මයක් බවත් ඔහු තේරුම් ගත්තේය. බියත් සමග වූ ජෝන්ගේ සටනේ හැරවුම් ලක්ෂය වූයේ මෙම එළිදරව්වය.

ජෝන් ඉතා උවමනාවෙන් යාච්ඤා කරන්න පටන් ගත්තේය. තමාට ශක්තිය සහ පැහැදිළි මනසක් ලබා දෙන ලෙස ඔහු දෙවියන්වහන්සේගෙන් ඉල්ලීය. ඔහුට නිවැරදි තීරණ ගන්න දෙවියන්වහන්සේ උපකාර කිරීම ඔහුට අවශ්‍ය වූ නිසා ඔහු බයිබලය කියවන්නත් එහි පොරොන්දු ගැන මෙනෙහි කරන්නත් ඔහු පටන් ගත්තේය.

ක්‍රමයෙන් ඔහුට ශක්තිමත් කමක් සහ තමා ගැන විශ්වාසයක්ද ඇති වුනි. දෙවියන් වහන්සේගේ බලය ඔහු තුළ තිබුණු හෙයින් ඔහු බිය විය යුතු නැති බව ඔහු තේරුම් ගත්තේය.

නව දැක්මක් සමග ජෝන් තම ව්‍යාපාර අභියෝගයන් දෙස වෙනස් ආකාරයකින් බැලුවේය. දෙවියන් වහන්සේගේ මග පෙන්වීම මත යැපෙමින් ඔහු හොඳ තීරණ සන්සුන් සහ පැහැදිලි මනසකින් අර ගත්තේය. එසේම පීඩා විඳින අනිකුත් ව්‍යාපාරයන්ට උපකාර කිරීමට කණ්ඩායමක් ඔහු පටන් ගත් අතර ඇදහිල්ලෙන් බිය ජය ගත හැකි බවට සාක්ෂි දැරීය. ඔහුගේ සාක්ෂිය බෙදා ගැනීමෙන් ඔහුගේ බිය පහව යන බව ඔහුට වැටහුණි.

කාලයාගේ ඇවෑමෙන් ජෝන්ගේ ව්‍යාපාරය දියුණු වන්න පටන් ගත්තේය. ඔහු ආරම්භ කළ කණ්ඩායම වර්ධනය වූ අතර බිය ජයගැනීමේ ඔහුගේ ඇදහිල්ලේ පණිවුඩය නිසා බොහෝ ජීවිත වෙනස් විය. ජෝන්ගේ අත්දැකීම ඔහුගේ ව්‍යාපාරය නැවත ගොඩ නැගීම ගැන පමණක් නොව ඔහු තුළ දැනටමත් දෙවියන්වහන්සේ විසින් තබා ඇති බලයේත් ප්‍රේමයේත් හික්මවීමේත් ආත්මය ගැනද වන්නේය.

සමහර විට බිය ශක්තිමත් සහ අපව අඩපණ කරන එකක් විය හැකි වුවත් එය පරාජය කළ නොහැකි එකක් නොවේ. දෙවියන්වහන්සේ විසින් අපට ලබා දී ඇති බලයේත් ප්‍රේමයේත් හික්මවීමේත් ආත්මය කෙරෙහි එල්ලීගෙන සිට අපට බිය ජය ගෙන ජයග්‍රාහී ජීවිත ගත කළ හැකිය. 2 තිමෝති 1:7 පොරොන්දුව සිතේ තබා ගෙන එය ඔබගේ ඇදහිල්ලේ අත්තිවාරම කර ගන්න. ජෝන් තමාගේ බිය ජය ගෙන අලුත් ක්‍රමවේදයක් සොයා ගත්තාක් මෙන් දෙවියන්වහන්සේගේ ශක්තියේ ප්‍රේමයේ සහ ප්‍රඥාවේ එල්ලී ගෙන ඔබටත් ඔබ මුහුණ දෙන බියෙන් ජය ගත හැකිය. දෙවියන්වහන්සේ ඔබ සමග වන නිසා උන්වහන්සේ ගැන විශ්වාස කරන්න. එසේම උන්වහන්සේ ඔබට බයාදුකමේ ආත්මයක් ලබා දී නොමැත. දෙවියන්වහන්සේ ඔබ සමග සිටිමින් ඔබව ධෛර්‍යයමත් කරන සේක්වා.

# ප්‍රේමය

## පවුල් එකට එක් කර තබයි

**කොලොස්සි 3:14 හි දක්වා ඇති පරිදි මෙම මාසයේදී ඔබගේ පවුල උන්වහන්සේගේ ප්‍රේමයෙන් වටකර තැබීමට දෙවියන්වහන්සේ පොරොන්දු වන බව සහතිකය.**

“මේ සියල්ලට උඩින් ප්‍රේමය නැමති සම්පූර්ණ කමේ බැම්ම බැඳගනිල්ලා”.

පවුලේ පිටුව



සෑම නිවසක් තුළම මහත්වූ ප්‍රේමයක සහ එක්සත්කමක බැම්මක් පවතී. තනි තනි හදවත් මෙන්ම පවුල්ද පරීක්ෂා සහ පීඩාවන්ට මුහුණ දෙති. නමුත් සෑම තත්ත්වයක් යටතේම පවුලේ එකිනෙක සාමාජිකයාව බැඳ තබන මැලියම් මෙන් පවතින්නේ ප්‍රේමයයි. දේව වචනයේ කොලොස්සි 3:14 මෙම සදාකාලික සත්‍යය පැහැදිළි කර දෙයි. “මේ සියල්ලට උඩින් ප්‍රේමය නැමති සම්පූර්ණකමේ බැම්ම බැඳ ගනිල්ලා”. මෙම මාසයේදී අපගේ පවුල් සම්පූර්ණ සමාදානයෙන් සහ ප්‍රීතියෙන් තබන්න දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඉවහල් වන ආකාරය ගැන සිතා බලමු. අපෝස්තලු පාවුල් විසින් කොලොස්සි සභාවට ලියන ලද ලිපිය ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය පරාවර්තනය කරන ආකාරය ගැනත් උන්වහන්සේගේ ඉගැන්වීම් අනුව ගමන් කරමින් ජීවත් වන්නේ කෙසේද යන්න ගැනත් වූ බොහෝ උපදෙස් වලින් පිරී පවතී.



කොලොස්සි 3:14 හි පාවුල් කථා කරන්නේ අන් සෑම දෙයකටම වඩා ප්‍රේමය කෙතරම් වැදගත්ද යන්න ගැනයි. මෙම ප්‍රේමය හැඟීමක් පමණක් නොවේ. එය වැදගත් චරිතාංග වන අනුකම්පාව, කරුණාව, යටහත්කම, මෘදුකම සහ ඉවසීම යනාදිය බැඳ තබන ක්‍රියාකාරී බලවේගයද වන්නේය.

මෙම චරිත ගුණාංග ප්‍රේමයෙන් එකට එක්ව තිබෙන කල එය පවුල් තුළ ශක්තිමත් සහ කඩා දැමිය නොහැකි බන්ධනයක් ඇති කරන්නේය. ඇන්ඩර්සන් පවුලේ කථාව ගැන සළකා බලන්න. එම කථාවෙන් ජනතාව එකට එක් කර විශාල වෙනසක් සිදු කරන්න ප්‍රේමයට හැකිවූ ආකාරය පෙන්නුම් කරයි. ජෝන් සහ මේරි ඇන්ඩර්සන්ද ඔවුන්ගේ දරුවන් වන ඇනා, මාර්ක් සහ ලීසාද කුඩා නගරයක ජීවත් වූහ.

ජෝන්ට රැකියාව අහිමි වූ අවස්ථාවේදී ඔව්හු මූල්‍යමය වශයෙන් අපහසු කාලයක් සහ විවාද වලින් සහ මතභේද වලින් පිරුණු සම්බන්ධතාවයන් නිසා ඉතාම අසීරු කාලයක් ගත කළහ.

Email: evangeline@jesuscalls.org EvangelinePaulDhinakaran

දෙවියන්වහන්සේගේ වෙනස් කිරීමේ බලය ගැන විශ්වාස කළ මේරි කොලොස්සි 3:14 ගැන සිහිපත් කරමින් එක්නෙකාට ප්‍රේමය සහ කරුණාව දක්වන ලෙසට පවුලම දිරිමත් කළාය.

ශීත සෘතුවේ එක් සන්ධ්‍යාවක එකිනෙකා ගැන තම තමන් වඩාත් ප්‍රේම කරන සහ අගය කරන දේවල් ගැන බෙදා ගනිමු කියා ඇය යෝජනා කළාය. මුලින්ම දරුවන්ට ඒ ගැන වැඩි යමක් නොතිබුණු නමුත් ක්‍රමයෙන් ඔවුන් විවෘත වී එකිනෙකා කෙරෙහි තම තමන්ගේ හැඟීම් සහ අගය කිරීම් ගැන කථා කරන්න පටන් ගත්හ

මෙම ඉතා සරල ක්‍රියාව ඔවුන් එකිනෙකාට සමීප කරන්නත් ඔවුන්ගේ කාරුණික ක්‍රියා සහ ප්‍රේමය මතක් කරන්නත් උපකාර වුනි. ඔවුන් එකිනෙකාට සහාය දැක්වූහ. අවසානයේදී ජෝන්ට නව රැකියාවක ලැබුණු අතර එයින් ඔවුන්ගේ මූල්‍යමය තත්ත්වය යහපත් අතට හැරුණි. ඔවුන්ගේ නව බැඳීමේ අත්තිවාරම වූයේ ප්‍රේමයයි. ශක්තිමත් පවුල් බන්ධන ඇති කිරීමටත් විශ්වාසය සහ ගරුත්වය ගොඩ නංවා ගැනීමටත් මෙය කෙතරම් වැදගත්දැයි ඔවුහු දැන ගත්හ.

අපි මෙම මාසය තුළ ගමන් කරද්දී අපගේ පවුල් දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් බැඳෙනු ඇත යන උන්වහන්සේගේ පොරොන්දුව දෙස අවධානය යොමු කරමින් විශ්වාස කරමු. මෙම දිව්‍යමය ප්‍රේමය හැඟීමකට වඩා එහා ගිය දෙයකි. එය ක්‍රියාකරමින් කැප කිරීම් කිරීමකි. ක්‍රියාත්මක ලෙස ප්‍රේමය පෙන්වමින් පවුලේ එක්සත් කම ශක්තිමත් කර ගැනීමට ක්‍රම කිහිපයක් පහත දක්වමි.

1) අනුකම්පාව පෙන්වන්න :
එකිනෙකාගේ හැඟීම් සහ අභියෝගයන් ගැන සළකන්න. අවශ්‍ය තැන්වලදී සවන් දීම සහ සැනසිලිදායක වචනයක් ලබා දෙන්න.

2) කරුණාව පුහුණුකරන්න :
කරුණාවේ කුඩා ක්‍රියා පවා මහත් වෙනසක් කළ හැකිය. කාරුණික වචනයක් උපකාරයක් හෝ පවුල තුළ කල්පනාවෙන් කරන දෙයක් යනාදියට ඔබගේ ප්‍රේමණීයයාගේ දවස ආලෝකමත් කර බැඳීම ශක්තිමත් කළ හැකිය.

3) නිහතමානීකම වපුරන්න :
සෑම කෙනෙක්ම සර්ව සම්පූර්ණ නැති බව සිහි තබා ගන්න. වැරදි හරිගස්සා ගැනීමට ඇති ප්‍රධාන යතුර වන්නේ නිහතමානී කම නිසා සමාව ඉල්ලන්නත් සමාව දෙන්නත් සූදානම්ව සිටින්න.

4) ඉවසීම අභ්‍යාස කරන්න :
පවුල් ජීවිතය අවුල් සහගත සහ ආතතිය ඇති කරයි. අනවශ්‍ය අරගල ඇති නොකර අසීරු අවස්ථා ජය ගැනීමට ඉවසීම උපකාර වන්නේය.

5) ක්‍රියාවේදී මෘදුවන්න :
අර්බුදයන් සහ අමනාපකම් ගැන මෘදු ලෙස සළකන්න. සන්සුන් සහ මෘදු පිවිසුමක් ආතතිය අඩු කර පවුල තුළ තේරුම් ගැනීම වර්ධනය කරන බව කොලොස්සි 3:14 පෙන්වා දෙයි.

> ආදරය යනු අන් සියල්ලන්ම පරිපූර්ණ සමගියකින් බැඳ තබන පරම ගුණයකි

සෑම දෙයක්ම ස්ථිර ප්‍රීතියකින් එකට බැඳ තබන ඉතාම වැදගත් ගුණාංගය ප්‍රේමය බව කොලොස්සි 3:14 පවසන්නේය. මෙම මාසයේදී ඇන්ඩර්සන් පවුල කළාක් මෙන් ක්‍රිස්තුස්වහන්සේගේ මෙන් ප්‍රේමයක්

අපගේ පවුල් තුළ ඇති කිරීමට කැප වෙමු. අනුකම්පාව, කරුණාව, නිහතමානීකම, ඉවසීම සහ මෘදුකම වැනි ශුද්ධාත්ම ඵල පුහුණු කරමින් සහ වර්ධනය කරමින් ක්‍රිස්තුස්වහන්සේ මධ්‍යස්ථය වන ප්‍රේමණීය නිවසක් අපට ඇති කරගත හැකිය.

අපගේ හදවත් උන්වහන්සේගේ ප්‍රේමයෙන් පිරී අපගේ නිවෙස් වල ප්‍රීතිය ඇති වන්නේය. දැන් සහ සෑම විටම දෙවියන්වහන්සේගේ ප්‍රේමය සමාදානය සහ එක්සත් කම අපගේ පවුලට ගෙන ඒවි යයි විශ්වාස කරමු. ඔබගේ පවුල් ජීවිතයේ මෙම අනුග්‍රහයේ අත්දැකීම ඔබ ලබන ලෙසට මම යාච්ඤා කරමි.

විශ්වාස කරමි.

# මාගේ හදවත පත්ලෙන්ම මම කෘතඥකරමි

ස්වාමීන්වහන්සේගේ සේවය තුළ මාගේ අනගි මිතුර,

පිලිප්පි 1:4-5 දක්වා පාවුල් කියන්නාක් මෙන්

“මම සෑම විටම නුඹලාට ප්‍රේම කරමි. මගේ සෑම යාච්ඤාවකම ඔබගේ ජීවිතයේ නියත සහ භෞතික අවශ්‍යතාවයන් සපුරාලන ලෙස මම දෙවියන්වහන්සේගෙන් ඉල්ලමි. එසේම ඔබ වෙනුවෙන් යාච්ඤා කිරීම මගේ ජීවිතයේ ඉතාමත්ම ප්‍රීතිමත් අවස්ථාව බව ඔබ දැන ගන්නවාට මම කැමැත්තෙමි. මක්නිසාදයත් මුල සිටම ශුභාරංචි වැඩ වලදී ඔබ මාගේ හවුල් කරුවානන් වූ අතර තවමත් ඔබ මා සමග සිටින බැවිනි. එම නිසා ඔබ වෙනුවෙන් යාච්ඤා කිරීම මට නම් ඉමහත් ප්‍රීතියකි.



දෙවියන්වහන්සේගේ සේවය වෙනුවෙන් ඔබ කරන දේ ගැන මම ඔබට ස්තුතිවන්ත වෙමි. යේසුස් කැඳවයි සේවය මගින් ශුභාරංචිය පැතිරවීම සඳහා අප හා හවුල් වීම ලෙහෙසි පහසු කාර්යයක් නොවේ. එය ඔබගේ ජීවිතයේ ඔබට කළ හැකි මහඟු සේවයකි. ඔබ යේසුස්වහන්සේ ඉදිරියෙහි සිටගෙන සිටිද්දී ඔබ සේවය වෙනුවෙන් වපුරන ලද ත්‍යාගයන් නිසා ස්වර්ගයේ සිටින ජනතාව දෙස බලන විට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සේවයේ ව්‍යාප්තිය වෙනුවෙන් ඔබ විසින් දෙන සෑම රුපියලකම බලය ඔබ ඇත්තෙන්ම තේරුම් ගන්නා සම්පූර්ණ අවස්ථාව එය වන්නේය.
ඔබ වපුරන දේ ඇත්ත වශයෙන්ම මහත් වෙනසක් සිදු කරන්නේය. එම නිසා ඔබගේ පංගුකාරත්වය ගැන ආශිර්වාද සහ විපාකයන් මෙහිදී සහ සදාකාලයේදීද ඔබට අයත් වන්නේය. ඔබ මෙම සැප්තැම්බර් මාසයට ඇතුල් වෙද්දී ඔබ සහ ඔබගේ පවුල වෙනුවෙන් වර්ධනය කිරීමේ බහුලවූ ආශිර්වාදයන් දෙවියන්වහන්සේ වගුරුවන සේක්වා. ඒ ඔබ උන්වහන්සේගේ රාජ්‍යය වෙනුවෙන් විශ්වාසවන්තව වපුරන ලද දේ නිසා ද්විතීය කථාව 28:1 හි පොරොන්දු වී ඇති ආකාරයෙන් ඔබගේ ජීවිතය උසස් කරන සේක්වා.

**“නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ පොළොවේ සියලු ජාතීන්ට වඩා නුඹ උසස් කොට තබන සේක”.**

මෙහිදී පසුගිය මාසයේදී සිදුවූ වැදගත් සිද්ධීන් මෙන්ම මෙම මාසයේ ප්‍රමුඛතාවයන් කෙටියෙන් ඉදිරිපත් කරන්නෙමි. මෙම වැදගත් කාර්යයන් සඳහා අපි ඔබගේ යාච්ඤාවන් සහ මූල්‍යමය සහාය අගය කරන්නෙමු.

**ප්‍රශංසා කරුණු**

2024 ජූලි මස 16 වන දින මගේ බිරිඳ අඩියාර් යාච්ඤා කුළුණේදී දේව වචනය බෙදා ගත්තාය. පැමිණ සිටි සිය ගණනකට ඇගේ පණිවුඩය සහ යාච්ඤාවන් මහත් ආශිර්වාදයක් විය. තමන් මධ්‍යයේ දෙවියන්වහන්සේගේ බලවත් හැසිරීම ගැන උන්වහන්සේට ප්‍රශංසා කරමින් ජනතාව පිටව ගියහ. සියලු මහිමය දෙවියන්වහන්සේටයි.
2024 ජූලි මස 17 වන දින චෙන්නායි ඉන්දියාවේ කිතුනු සභාපාලක වරුන්ගේ සම්මේලනයේදී දේශනා කිරීමේ භාග්‍යය මට ලැබුණි. යේසුස්වහන්සේගේ ප්‍රේමය ව්‍යාප්ත කිරීම සඳහා දහස් ගණන් සභාපාලක වරුන්ට කථා කිරීමේ අත්දැකීම මනහර ක්‍රියාවකි. උන්වහන්සේගේ වචනයෙන් උන්වහන්සේගේ සේවකයන් දිරිමත් කිරීමටද වෙහෙසට පත් නොවී ස්වාමින් වහන්සේගේ සේවය කර ගෙන යාමට ඔවුන්ව සන්නද්ධ කිරීමටද දෙවියන්වහන්සේ මහත් දයාවෙන් යුතුව මාව පාවිච්චි කළ සේක. යාච්ඤා කාලයේදී දෙවියන්වහන්සේ බලවත් ලෙස ක්‍රියා කළ සේක. උන්වහන්සේගේ මහිමයෙන් ස්ථානය පිරී ගියේය.

2024 ජූලි මස 21 වන දිතාම්බරම් යාච්ඤා කුළුණේදී මගේ දියණිය ස්ටෙලා රමෝලා සහ ඩැනියෙල් ඩේවිඩ්සන් නමස්කාරය මෙහයෙවා දේව වචනය බෙදා ගත්හ. නමස්කාර කාලය මෙන්ම දේව වචනයද බොහෝ හදවත් විශේෂයෙන්ම තරුණ හදවත් බලවත් ආකාරයකින් ස්පර්ශ කළහ. ඒ මගින් දෙවියන්වහන්සේගේ නාමය මහිමයට පත් වුනි.
අගෝස්තු 4 වන දින චෙන්නායි බලාපොරොත්තුවේ දේව සභාවට සහභාගී වීමට අපට අවස්ථාව ලැබුණි. උත්පත්ති 12:2 න් දේව වචනය බෙදා ගන්න අපට ඇරයුම් ලැබුණි. “ නුඹට ආශිර්වාද කොට නුඹේ නාමය කීර්තිමත් කරන්නෙමි. නුඹද ආශිර්වාදයක් වෙයන්න”. මුළු සභාවකටම දේශනා කිරීම සහ පුද්ගලයන්ට යාච්ඤා කිරීම මහත් ප්‍රීතියක් වුනි.

# යේසුස් කැදවයි සේවය
## සමග ඔබේ හවුල්කාරිත්වය ශුභාරංචිය බෙදා ගැනීම, වහලුන් නිදහස් කිරීම සහ බලපොරොත්තු නැති වූවන්ට බලපොරොත්තුවක් ගෙන ඒමට බලපෑමක් ඇති කර ඇත

- 2024 අගෝස්තු 6 වන දින ස්ටෙලා රමෝලා සහෝදරිය සහ ඩැනියෙල් ඩේවිඩ්සන් සහෝදරයා නමස්කාරය මෙහෙයවා යේසුස් කැඳවයි නිරාහාර යාච්ඤාවේදී දේව වචනය බෙදා ගත්හ. එහි රැස්ව සිටි සැමටම එය මහත් ආශිර්වාදයක් විය.

- වනග්‍රම් යාච්ඤා කුළුණේ නිරාහාර හාස්කම් යාච්ඤාව 2024 අගෝස්තු 10 වන දින පැවැත්වුනි. මෙම රැස්වීම අතර තුර උන්වහන්සේ කළ මහත් හාස්කම් නිසා දෙවියන්වහන්සේගේ බලය එළි දැක්වුනි. උන්වහන්සේගේ අති මහත් ක්‍රියාවන් නිසා මම උන්වහන්සේගේ නාමය උසස් කරමින් උන්වහන්සේට සියලු මහිමය දෙමි.

**දේශය වෙනුවෙන් නොනවත්වා කෙරෙන යාච්ඤා**

**"ඉතින් අප විසින් සියලු ආකාර භක්තියෙන් සහ සන්සුන්කමින් සමාදානවූ නිශ්චල ජීවිතයක් ගත කරන පිණිස රජවරුන් සහ උසස් තනතුරු දරණ සියල්ලන් ඇතුළුව සියලු මනුෂ්‍යයන් උදෙසා ඉල්ලීම්ද යාච්ඤාද මැදහත්කම්ද ස්තුතිදීම්ද පවත්වන්ට සියල්ලට පළමුවෙන් අවවාද කරමි" (1 තිමෝති 2:1-2).**

මෙම වසර දිල්ලි ජාතික යාච්ඤා කුළුණේ 14 වන සංවත්සරය පැවැත්වේ. එහිදී ඉන්දියා දේශය සහ එහි ජනතාව සඳහා පැය 24 පුරාම යාච්ඤාවන් එසවේ. දෙවියන්වහන්සේගේ සර්වබලධාරී අභිමුඛය සහ කැමැත්ත ඉන්දියා දේශය මතට පැමිණීම වෙනුවෙන් මෙම යාච්ඤා කුළුණ ගොඩ නැගීම ගැන අපි දෙවියන්වහන්සේට ස්තුති කරමු.

දේශයේ සෑම අස්සක් මුල්ලකින්ම ජනතාව බරකින් යුතුව මැදහත්කාර කම් කිරීම සඳහා මෙම යාච්ඤා කුළුණට පැමිණේ.

**රැකියා ආශිර්වාද සැළැස්ම**

**"ස්වාමීන්වහන්සේගේ ආශිර්වාදය පොහොසත්කම ලබා දෙන්නේය. උන්වහන්සේ ඊට දුක එකතු නොකරන සේක" (හිතෝපදේශ 10:22).**

මෙම මාසය රැකියා ආශිර්වාද සැළසුමේ 16 වන වසර ලකුණු කරන්නේය. සමාජය සහ රට ව්‍යාපාරිකයන්ගේ සාර්ථකත්වය ලබන පිණිස මෙම සැළසුම ඔවුන් වෙනුවෙන් මැදහත්කාරකම් කරති.
ඔබත් ව්‍යාපාරිකයෙක් නම් තවමත් මෙම සැළසුමට සම්බන්ද වී නැත්නම් කරුණාකර එසේ කිරීම ගැන සළකා බලන්න. බොහෝ දෙනෙක් මේ තුළින් ආශිර්වාද ලබා තිබේ.

**බාධාවකින් තොරව දේව වචනය වැපිරීම**

**"වචනය දේශනා කරපන්න. කලටත් අකලටත් වැඩේ යෙදී සිටපන්න. සියලු ආකාර ඉවසිලිවන්ත කමෙන් සහ ඉගැන්වීමෙන් තරවටු කර අවවාද කර අනුශාසනා කරපන්න කියායි" (2 තිමෝති 4:2)**

යේසුස් කැඳවයි වීඩියෝ සේවය 43 වන වසර සමරයි. මිලියන ගණනක් වෙතට යාමටත් ජීවිත වෙනස් කිරීමටත් අනාවැකි පණිවුඩ සහ ගීත හා යාච්ඤා ප්‍රචාරය කරන්නත් දෙවියන්වහන්සේ මෙම සේවය භාවිතා කරන සේක.

ඔබ රූපවාහිනි සේවයේ කොටස්කරුවෙක් වන්නේ නම් අපි අගය කරන්නෙමු. ඔබගේ විශේෂ දිනයන්හි එනම් උපන් දින හා විවාහ සංවත්සර වැනි දිනයන්හි වැඩ සටහනකට අනුග්‍රහය දක්වමින් ඔබට කොටස්කරුවෙක් විය හැකිය. ඔබට කරන විශේෂ ස්තුතියක් ලෙසට අනුග්‍රාහක කොටස්කරුවන් වෙනුවෙන් අපි විශේෂ යාච්ඤාවක් කරන්නෙමු.

**කැඳවන ලද්දවුන් සන්නද්ධ කිරීම**

**"කිසිම භයක්වත් තහනමක්වත් නැතුව දෙවියන්වහන්සේගේ රාජ්‍යය දේශනා කරමින් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන කාරණා ඉගැන්නුවේය" (ක්‍රියා 28:31).**

දෙවියන්වහන්සේගේ ආශිර්වාද සමග කාරුණ්‍යා විද්‍යා පීඨය සාර්ථක ලෙස සතරවන වසරට පා තබයි. සෑම කෙනෙක් වෙනුවෙන්ම වැදගත් බයිබලීය පද සහිත කෙටි කාලීන පාඨමාලාවන්ද අප ආරම්භ කරන බව ප්‍රීතියෙන් දැනුම් දෙමු. දේව ධර්මය ගැන ඔබගේ දැනුම ගැඹුරු කර ගැනීමට මෙය මහඟු අවස්ථාවක් වෙනවා නොඅනුමානය.

**ඉදිරියට එන රැස්වීම්**

2024 සැප්තැම්බර් 14 :වනග්‍රම් නිරාහාර යාච්ඤාව

2024 සැප්තැම්බර් 21 :බෙංගලූර් කොටස්කරුවන්ගේ රැස්වීම

2024 සැප්තැම්බර් 22 : බෙංගලූර් ඉරු දින දේව මෙහෙය

මෙම සිද්ධීන් ඔබගේ යාච්ඤාවේ තබා ගන්නා ලෙසත් ඒ අසල සිටින ඔබගේ ප්‍රේමණීයයන්ට ඒ බව දන්වා මෙම රැස්වීම් වලට සහභාගී වී ආශිර්වාද ලබන ලෙසත් දන්වා සිටින්න. එසේම මෙම යාච්ඤා රැස්වීම් සඳහා ඔබගේ ආධාර බලාපොරොත්තු වන අතර ඒ තුළින් මිලියන ගණනක් ජීවිත වල බලාපොරොත්තුව වන්න.



2024 සීෂා ව්‍යාපෘතියේ තවත් සමාජ මෙහෙවරයන් කිහිපයක්ම දියත් කිරීමට දෙවිදුන්ගේ කරුණාව ලැබුණි. ඉන් එක් මෙහෙවරක් වශයෙන් මහා මාර්ගය පිරිසිදු කරන්නන් හට දිවා ආහාර වේලක් ලබා දී ඔවුන් හට යාච්ඤාවෙන් සහ ශුභාරංචිය ඔවුන්ගේ හදවත් සුවපත් කලේ.





තවත් එක් මෙහෙවරක් වශයෙන් හපුතලේ, මන්නාරම, යාපනයේ ප්‍රදේශ කිහිපයක්, ගම්පොළ, මඩකලපුව යන ප්‍රදේශයන් හී පාසල් ළමුන් සඳහා රු. 1500 ක් වටිනා පාසල් බෑග් ලබා දෙන ලදියි. ඒ සමගම ඔවුන් හට ජීවත් වීමට ආදර්ශමත් අවවාදයන් කිහිපයක් ලබා දී දෙවිදුන්ගේ ප්‍රේමයේ පණිවිඩයද ඔවුන් සමග බෙදා ගන්නා ලදියි.





**මෙවරත් පාසල් ලමුන් දහසක් සදහා රු. 1500.00 ක් වටිනා පාසල් බෑග් ලබා දීමට සැලසුම් කර ඇත. ඒ සදහා උපකාර කිරීමට ඔබත් කැමති නම් පහත සදහන් අපගේ සීෂා ගිණුම වෙත ඔබගේ මුදල් බැර කරන්න.**



**8106022516**
**Jesus Calls International**
**Commercial Bank,**
**Bambalapitiya.**







# ශුභාරංචි රැස්වීම්

## මහනුවර





දෙවියන් වහන්සේගේ මහත් කරුණාවෙන් යුතුව මහනුවර ප්‍රදේශයේ ජනයන්ට දේව ශුභාරංචිය ලබා දෙමින් ආත්ම දිනා ගන්නා පිණිස එක් දින ශුභාරංචි රැස්වීමක් පැවැත් වූ අතර විශාල සෙනගක් දෙවියන් වහන්සේගේ සුවයද මිදීමද ස්පර්ශයද ලබා ගත්තෝය

## කුරුණෑගල

දෙවියන් වහන්සේගේ මහත් කරුණාවෙන් යුතුව කුරුණෑගල ප්‍රදේශයේ වාසය කරන ජනයන්ට දෙවියන් වහන්සේගේ ශුභාරංචිය ලබා දෙමින් ආත්ම දිනා ගන්නා පිණිස එක් දින ශුභාරංචිය රැස්වීමක් පැවැත් වූ අතර ඊට විශාල පිරිසක් සහභාගි වී දෙවියන් වහන්සේගේ සුවයද මිදීමද ස්පර්ශයද ලබා ගත්තේය





සතියක් හැර සතියක් සෑම බ්‍රහස්පතින්දා දිනකම පස්වරු 6ට තරුණයන් උදෙසා පවත්වනු ලබන විශේෂ වැඩසටහන අපගේ YOUTUBE , FACEBOOK යන අපගේ නිල නාලිකාවන්හී විකාෂය වේ.

turn SRI LANKA

JESUS CALLS SRI LANKA ONLINE

බම්බලපිටිය යාච්ඤා කුළුණේදී
සෑම බදාදා දිනක උදෑසන 10.00 දේශය උදෙසා නිරාහාර යාච්ඤාව ද
සෑම සිකුරාදා දිනකම සවස 5.30 සුව කිරීමේ දේව මෙහෙයද පැවැවේ.



**පැය 24 යාච්ඤා සේවාවන් ලබා ගැනීමට අමතන්න: 011 44 88 111 /011 2 555 401**

බම්බලපිටිය යාච්ඤා කුළුණ- 15/1 බී ජෝස්ප් පටුමග බම්බලපිටිය, කොළඹ 04. දුරකථන අංකය : 011 44 88 112
මට්ටක්කුලිය යාච්ඤා කුළුණ - 65/373, 5 වන පටුමග, කාක දූපත, කොළඹ 15. දුරකථන අංකය : 011 25 21 112
යාපනය යාච්ඤා කුළුණ - 32,පරණ උයන් පාර, වුන්ඩිකුලි. දුරකථන අංකය : 021 221 27 37